ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2513/06 - 2026 නොවැම්බර් මස 02 වැනි සඳුදා - 2026.11.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදනය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත
3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි 1978 ක් වූ අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍ය, බිමල් නිරෝෂන් රත්නායක වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ද. ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතුයැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

බිමල් නිරෝෂන් රත්නායක (පා. ම),
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය.

2026 ඔක්තෝබර් මස 26 වැනි දින,
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය,
6 වන මහල,
"සෙන්සිරිපාය" අදියර - II,
බත්තරමුල්ල.

උපලේඛනය I

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ සොරණාතොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රිදීපාන ග්‍රාම නිලධාරී වසම

නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම

I වන තීරුව

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල පිහිටියා වූ සොරණාතොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වන්නා වූ අංක. 26C රිදීපාන ග්‍රාම නිලධාරී වසම වන මෙහි II වන තීරුවෙන් විස්තර වන ඉම් සලකුණු සහ මායිම් වලින් සමන්විත වූ මුළු මහත් ප්‍රදේශය.

II වන තීරුව

උතුරට:

26A යටිලෑල්ල ග්‍රාම නිලධාරී වසම හා අඹගහඔය කඳුර

දකුණට:

බදුල්ල නගර සීමාව (බදුල්ල උතුර හා 78M මැදපතන ග්‍රාම නිලධාරී වසම)

බටහිරට:

26 කොහොවිල ග්‍රාම නිලධාරී වසම හා පිටපොල කඳුර

නැගෙනහිරට:

25D කොස්ගොල්ල ග්‍රාම නිලධාරී වසම හා බදුලු ඔය

EOG 11 - 0003